# කාර්යසාධන වාර්තාව සහ වාර්ෂික ගිණුම්

# செயற்திறன் அறிக்கையும் வருடாந்த கணக்குகளும்

# ANNUAL PERFORMANCE REPORT & ACCOUNTS

# 2014



## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මන්නාරම

## மாவட்டச் செயலகம் - மன்னார்

## DISTRICT SECRETARIAT-MANNAR

# පටුන


1. පණිවුඩ ... III
   - 1.1. ස්වදේශ කටයුතු අමාත්‍ය ... III
   - 1.2. ස්වදේශ කටයුතු ලේකම් ... IV
   - 1.3 දිස්ත්‍රික් ලේකම්/ දිසාපති ... V
2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අරමුණු හා කාර්ය භාර්ය ... 01
   - 2.1. දැක්ම, මෙහෙවර, අරමුණ ... 01
   - 2.2. දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිපාලන කටයුතු සිදු කිරීම ... 03
3. හැඳින්වීම ... 05
   - 3.1. දිස්ත්‍රික්කයේ මායිම් ... 05
   - 3.2. වැදගත් ස්ථාන ... 07
   - 3.3. දිස්ත්‍රික්කයේ ස්වභාවික සම්පත් ... 11
   - 3.4. දිස්ත්‍රික්කයේ ආර්ථික හා ජීවනෝපාය තත්වයන් ... 11
   - 3.5. දිස්ත්‍රික්කයේ වාරි මාර්ග කටයුතු ... 12
   - 3.6. දිස්ත්‍රික්කයේ ජනගහනය ... 13
   - 3.7. දිස්ත්‍රික්කයේ කාළගුණික තත්වය ... 14
   - 3.8. දිස්ත්‍රික්කයේ සංඛ්‍යා ලේඛන ... 14
4. ආයතන ව්‍යුහය සහ අනුමත කාර්ය මණ්ඩල තොරතුරු, සංවිධාන සිතියම ... 15
   - 4.1. කාර්යාලීය සංවිධාන සිතියම ... 15
   - 4.2. අනුමත කාර්ය මණ්ඩල තොරතුරු ... 16
5. කාර්ය සාධනය ... 18
   - 5.1. රාජ්‍ය පරිපාලන කටයුතු ... 18
     - 5.1.1. ග්‍රාම නිලධාරී ක්‍රියාකාරකම් ... 18
     - 5.1.2. අභ්‍යන්තර විගණන කටයුතු ... 18
     - 5.1.3. ආදායම් රැස් කිරීමේ ක්‍රියාකාරකම් ... 20
     - 5.1.4. මිනිස් බල හා රැකී රක්ෂා අමාත්‍යංශයේ දියත් කළ ක්‍රියාදාමයන් ... 21
     - 5.1.5. මැතිවරණ දෙපාර්තමේන්තුවේ ක්‍රියාදාමයන් ... 23
     - 5.1.6. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ක්‍රියාදාමයන් ... 24

5.1.7. ආපදා කළමනාකරණ කටයුතු පිළිබඳ ක්‍රියාදාමයන් ....................................25
5.1.8. මෝටර් රථ වාහන දෙපාර්තමේන්තුවේ ක්‍රියාදාමයන්....................................26
5.1.9. විශ්‍රාම වැටුප් පිළිබඳ ක්‍රියාකාරකම් ....................................................27
5.1.10. ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ ක්‍රියාදාමයන්................28
5.1.11. පරිපාලන ආශයේ ක්‍රියාදාමයන්.........................................................30
5.1.12. ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යංශයේ ක්‍රියාකාරකම් ..................31
5.1.13. තොරතුරු තාක්ෂණ උද්‍යාණයේ ක්‍රියාකාරකම්..........................................32

5.2. සංස්කෘතික හා සමාජ සේවා කටයුතු ......................................................33
5.2.1. සංස්කෘතික හා ආගමික කටයුතු පිළිබඳ ක්‍රියාකාරකම්................................33
5.2.2. ළමා හා කාන්තා සංවර්ධන කටයුතු පිළිබඳ ක්‍රියාදාමයන් ...........................35
5.2.3 ජාතික ළමා ආරක්ෂ අධිකාරියේ ක්‍රියාදාමයන්..........................................36
5.2.4. සමාජ සේවාවන් පිළිබඳ ක්‍රියාකාරකම් ..................................................37
5.2.5. දිස්ත්‍රික් ක්‍රීඩා අංශයේ ක්‍රියාදාමයන්.....................................................38

5.3. සංවර්ධන කටයුතු පිළිබඳ ක්‍රියාදාමයන් ..................................................40
5.3.1. රාජ්‍ය පරිපාලන ස්වදේශී කටයුතු පිළිබඳ අමාත්‍යංශයේ මුදල් ප්‍රතිපාදන යටතේ වන ප්‍රාග්ධන ව්‍යාපෘති -2014 ..................................................40
5.3.2. ග්‍රාමීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රියාදාමයන් ..................................43
5.3.3. දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රියාදාමයන් .............................46
5.3.4. ඉඩම් හා කෘෂි කර්ම දෙපාර්තමේන්තුවේ ක්‍රියාදාමයන් ..............................48
5.3.5. ඉඩම් පරිහරන හා සැලසුම් සංවර්ධන පිළිබඳ ක්‍රියාදාමයන් ..........................49
5.3.6. ආර්ථික සංවර්ධන අමාත්‍යංශයේ යටතේ වන ක්‍රියාදාමයන් ........................51
5.3.7. වගුගත කළ අමාත්‍යංශ හා අනෙකුත් දෙපාර්තමේන්තු වල වැය විස්තර වාර්ෂික ගිණුම් වාර්තාව ..............................................................61

5.4. වාර්ෂික ගිණුම්..................................................................................62
5.4.1. ඩී.ජී.එස්.ඒ – 2...............................................................................62
5.4.2. ඩී.ජී.එස්.ඒ – 3...............................................................................63
5.4.3. ඩී.ජී.එස්.ඒ – 4...............................................................................64
5.4.4. ඩී.ජී.එස්.ඒ -5 (i) ...........................................................................66
5.4.5. ආදායම් ගිණුම................................................................................67
5.4.6. සටහන (ii).....................................................................................68

## මනුෂ්‍යත්වයෙන් පිරි රාජ්‍ය සේවයක පෙර ගමන් කරුවන් වෙමු........



යහපාලනය සංකල්පය කේන්ද්‍රකරගත් සදාචාරාත්මක සමාජයක් ස්ථාපිත කිරීමේ අරමුණු පෙරදැරි කරගත් මෙම යුගය, ශ්‍රී ලාංකීය සමාජය අභිමුඛව ඇති සුවිශේෂ අවස්ථාවකි. එම අරමුණ සාක්ෂාත් කරගනු වස් සිවිල් පරිපාලනය සාධනීය ප්‍රතිසංස්කරණයන්ට ලක්කිරීමේ අවශ්‍යතාවය 2015 වසරේ දී අප විසින් සපුරා ගතයුතුව ඇති ප්‍රබලම අවශ්‍යතාවයයි.

ජනතා පරමාධිපත්‍ය ඉටුවන පරිදි යහපාලන සංකල්පය කේන්ද්‍රකරගෙන රාජ්‍ය සේවකයින් විසින් රජයේ සැලසුම් හා තීරණ ගැනීමේ ක්‍රියාවලියට දායක කරගැනීම හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල පුරවැසි අවශ්‍යතාවයන්ට වගවීමෙන් හා පාරදෘශ්‍යභාවයෙන් යුතුව ප්‍රතිචාර දැක්වීමක් වශයෙන් හඳුනා ගත හැකිය.

අභිනව රජයේ දින 100 වැඩ පිළිවෙළ යටතේ එළිදැක්වීමට නියමිත ව්‍යවස්ථා සංශෝධන, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය පාලනය වඩාත් කාර්යක්ෂම සහ ඵලදායීව ක්‍රියාත්මක කිරීමේ ප්‍රායෝගික සැලසුම් නිර්මාණයටත් අදාළ ප්‍රධානතම වගකීම පැවරී තිබෙන්නේ රජයේ ප්‍රමුඛ අමාත්‍යාංශයක් වන ස්වදේශ කටයුතු අමාත්‍යාංශයටය.

21 වන ශතවර්ෂයට ගැලපෙන පරිදි නව තාක්ෂණික ක්‍රම උපයෝගී කරගනිමින් මූල්‍ය ප්‍රතිපත්ති අනුව කටයුතු කරමින් පුරවැසියන්ගේ බදු මුදල් වියදම් කරන ආකාරය සහ එහි කාර්ය සාධනය මැනීමට හැකිවන පරිදි ප්‍රසිද්ධ කිරීම වැදගත් කාර්යයක් වේ. මෙවැනි වාර්තා පුරවැසියන්ට පරිශීලනය කිරීම තුළින් අප වගවීමෙන්, පාරදෘශ්‍යභාවයකින්, ඵලදායීව හා කාර්යක්ෂමව කටයුතු කරන්නේද යන්න සම්බන්ධව තොරතුරු දැනගැනීම සඳහා වන අයිතිය තහවුරු කිරීමක් වේ.

රාජ්‍ය සේවයේ යුතුකම් හා වගකීම් ඉටුකරමින් මා හා එක්ව ජනහිතවාදී ආකර්ෂණීය සේවයක් ලබාදීමට කැපවෙන අමාත්‍යාංශ ලේකම් සහ දිස්ත්‍රික් ලේකම් ප්‍රමුඛ සමස්ථ කාර්ය මණ්ඩලයට ස්තූතිවන්ත වන අතර 2015 වසරේ ඉදිරි ඉලක්ක ජයගැනීමට එක්ව කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීමට ඔබගේ දායකත්වය අපේක්ෂා කරමි.

එම්. ජෝශප් මයිකල් පෙරේරා (පාර්ලිමේන්තු මන්ත්‍රී)
ස්වදේශ කටයුතු අමාත්‍ය

# රාජ්‍ය සේවයේ යහපාලනය පෙරදැරිකරගත් හෙටක් වෙනුවෙන් ............



ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යනු මෙරට විශිෂ්ටතම හා සුවිශේෂී අමාත්‍යාංශයක් ලෙස හැඳින්වීම නිවැරදිය. දිවයින පුරාම විධිමත් පරිපාලනමය ව්‍යුහයකින් සහ පුළුල් ජාලයකින් සමන්විත වූ මෙම අමාත්‍යාංශය මගින් දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය සංවර්ධන කාර්ය සඳහා පුළුල් දායකත්වයක් සපයා ඇත. එසේම සංවර්ධන ක්‍රියාදාමයන්හි මහඟු ප්‍රතිඵල, බිම් මට්ටම දක්වා ගෙනයාමටද ඉවහල් වී ඇත.

2014 වර්ෂය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් ඉටු කරන ලද මෙහෙවර ඇතුළත් "වාර්ෂික කාර්යසාධන හා ගිණුම් වාර්තාව" වෙත පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම මා ලද භාග්‍යයක් ලෙස සලකමි.

පසුගිය වසර පුරාවට රාජ්‍ය අංශයේ කටයුතු විධිමත් කිරීමෙහි ලා දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් සිදුකළ සේවය අතිශයින් වැදගත්වේ. ඒ සඳහා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ පවතින දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් විශිෂ්ට දායකත්වයක් ලබාදී ඇති බව සිහිපත් කරන්නේද ස්තුති පූර්වකවය.

ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල පුළුල් ජනතා සේවයක් වෙනුවෙන් කැපවී සිටී. 21 වන ශතවර්ෂයට ගැලපෙන පරිදි ජනතා අපේක්ෂා ඉටුකිරීමෙහිලා සමීප සේවාවක් ලබාදීම සඳහා නවීන තොරතුරු තාක්ෂණය යොදාගැනීමටද දිස්ත්‍රික් ලේකම් කාර්යාල කටයුතු කර තිබේ.

මෙතෙක් ආ ගමන් මඟ තුළ අප ලත් අත්දැකීම් පෙරදැරි කරගෙන ඉදිරියටත් මහජනතාව වෙත කාර්යක්ෂමවූත්, ඵලදායීවූත් රාජ්‍ය සේවයක් ඉටු කිරීම සඳහා 2015 ජනවාරි මස සිට "ස්වදේශ කටයුතු අමාත්‍යාංශය" නමින් රටේ පරිපාලනය ව්‍යුහය යහපාලනය හා සංවර්ධනය සඳහා අප අමාත්‍යාංශයේ උපරිම දායකත්වය ලබාදීම රාජ්‍ය සේවයේ විශිෂ්ඨයන් වන ඔබගෙන් උදක්ම බලාපොරොත්තු වෙමු. ඒ රාජ්‍ය සේවයේ විශිෂ්ටත්වය පෙන්වන හෙටක් වෙනුවෙනි.

එස්.ඩී.ඒ.බී. බොරලැස්ස
ලේකම්
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මන්නාරම

### දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිගේ පණිවුඩය



මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 වසර සඳහා වු කාර්ය සාධන සහ ගිණුම් වාර්තාව ඉමහත් සතුටින් ඉදිරිපත් කරමි. ප්‍රාදේශිය ලේකම් කාර්යාල 5 කින් සමන්විත දිස්ත්‍රික්කය තුල විවිධ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු සමග එක්ව ක්‍රියාත්මක කරන ලද වැඩ සටහන්, ව්‍යාපෘති සහ ක්‍රියාකාරකම් 2013 කාර්ය සාධන සහ ගිණුම් වාර්තාවෙන් හෙළි දැක්වේ.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාල සමග ඒකාබද්ධව සියළුම සේවා සපයන ආයතන, ශාඛාවන් සහ සියළුම නිලධාරින් පූර්ණ කැපවීමෙන් කටයුතු කලහ.

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ප්‍රතිපාදන වෙන්කරන ලද දිවිනැගුම වැඩ සටහන / සමෘද්ධි සංවර්ධන වැඩ සටහන ඉතා සාර්ථකව ක්‍රියාත්මක කෙරිණි. විවිධ රේඛිය අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු මගින් වෙන්කරන ලද මුදල් උපයෝගි කරගෙන ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති විස්තරද මෙම වාර්තාවෙන් හෙළි දක්වයි.

අවසාන වශයෙන් මෙම දිස්ත්‍රික්කයේ ජනතාවගේ අවශ්‍යතාවයන් සහ සංවර්ධන සේවාවන් ගුණාත්මකව සහ ඵලදායිව සිදු කිරීමට විවිධාකාරයෙන් සහයෝගය දැක්වූ උපදෙස් ලබාදුන් දිස්ත්‍රික් දේශපාලන නායකත්වයටද, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් තුමාටද අනෙකුත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු නිලධාරින්ටද ප්‍රාදේශිය ලේකම්වරුන්ටද දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන් ඇතුළු සියළුම නිලධාරින්ටද මගේ ස්තුතිය පිරිනමමි.

ස්තුතියි

එම්.වයි.එස්.දේශප්‍රිය
දිස්ත්‍රික් ලේකම්/ දිසාපති
මන්නාරම පරිපාලන දිස්ත්‍රික්කය

# 2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අරමුණු හා කාර්ය භාර්ය

## 2.1

### දැක්ම

මන්නාරම ජනතාවගේ ජීවන තත්වය නගා සිටුවීම සඳහා වූ තිරසාර සංවර්ධන ක්‍රියාවලියේ පුරෝගාමී මෙහෙයුම්කරු.

### මෙහෙවර

රජයේ සංවර්ධන ඉලක්ක ලඟා කර ගැනීම සඳහා දිස්ත්‍රික්කයේ හා ප්‍රාදේශීය මට්ටමේ පවතින ආයතන වල ක්‍රියාවලිය සම්බන්ධීකරණය කිරීම, ඔවුන්ගේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සහ කාර්යක්ෂමව, ඵලදායී සේවා සැපයීම තහවුරු කරමින් අවම පිරිවැයෙන් අවශ්‍යතාවයන් ඉටු කරමින් ජනතාවගේ අවශ්‍යතා සැපයීම.

### අරමුණ

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අරමුණ වන්නේ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන් මඟින් විවිධ නීති රීති වලට යටත්ව පවරා ඇති වැඩ කටයුතු ඒකාබද්ධ කිරීම, සමාජ, ආර්ථික, සංවර්ධන ව්‍යාපෘති ඇති කිරීම. එය අධීක්ෂණය කිරීම් හා නිරීක්ෂණය කිරීම් සිදු කොට එම අවශ්‍යතාවයන් වෙනුවෙන් කටයුතු කර ඒවා තහවුරු කිරීමය.


2013/11/13



## 2.2 දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිපාලන කටයුතු සිදු කිරීම.

- සේවකයින් සම්බන්ධව සියළු කටයුතු සිදු කිරීම. (පුද්ගලික ලිපි ගොණු, නිවාඩු, වැටුප්, අතිකාල දීමනා, නිවාඩු දින දීමනා, සේවක ගමන් බලපත්‍ර, ණය සහන)
- පොදු ජනතාව සඳහා සේවය ලබා දීම සහ ඒවා පහසුවෙන් ලබා ගැනීම සඳහා මාර්ග සැකසීම.

- ✓ ගමන් බලපත්‍ර, හැඳුනුම්පත් ලබා දීම, මෝටර් ප්‍රවාහන බද්ධ, ව්‍යාපාර අවසර පත්‍ර, උප්පැන්න මරණ සහ විවාහ සහතික, මාර්ග ප්‍රවාහන බලපත්‍ර ලබා දීම.
- ✓ රියදුරු බලපත්‍ර ලබා දීම.
- ✓ ඡන්දහිමියන් ලියාපදිංචි කිරීම.
- ✓ ඉඩම් ඔප්පු සහ බලපත්‍ර ලබාදීම විධිමත් කිරීම සහ ඉඩම් ගැටළු විසඳීම.
- ✓ වැඩිහිටි සහ ආබාධිත අය සඳහා මාසික සහනාධාරය.
- ✓ මහජනතාවගේ මානසික සුවතාවය නංවාලීම සඳහා කටයුතු කිරීම.
- ✓ රැකියා විරහිත තරුණ තරුණියන් සඳහා රැකියා පුහුණු සහ කාන්තා ගෘහ මූලික පවුල් සඳහා ස්වයං රැකියා පුහුණුව හා දිරිගැන්වීම.

ලේකම් කාර්යාලයේ අරමුණු කරා ළඟාවීම සඳහා කාර්යක්ෂම ලෙස ප්‍රතිපාදන ලබා දී ගිණුම් ක්‍රම අනුගමනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

- ✓ දිස්ත්‍රික්කයට වෙන් කරන ලද වාර්ෂික ප්‍රතිපාදන නිසි අනුමැතිය සමඟ ඵලදායී ලෙස භාවිතා කිරීම සහ ගණන් තැබීම.
- ✓ සේවකයන් සඳහා සියළු දීමනා ලබා දීම.
- ✓ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තිබෙන මුදල් නිසි අවසරය මත අදාල අවශ්‍යතාවයන් සඳහා භාවිතා කිරීම.
- ✓ මාසික, වාර්ෂික වාර්තා දෙපාර්තමේන්තු වලට, අමාත්‍යංශ වලට සහ භාණ්ඩාගාරයට යැවීම.
- ✓ දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ලබා ගනු ලබන සේවා සඳහා දීමනා
- ✓ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ, වාර්ෂික ලැබීම සැලසුම් සකස් කිරීම.

දිස්ත්‍රික් කලා සංස්කෘතික කටයුතු සහ කාර්යක්ෂමතාවය සවිමත් කිරීම සඳහා කටයුතු කිරීම. ඒ සඳහා මාර්ග සකස් කිරීම.

සංස්කෘතික උත්සව පැවැත්වීම, දිස්ත්‍රික් හා ජාතික මට්ටමේ වැඩසටහන්

දිස්ත්‍රික්කයේ තිබෙන සම්පත් කාර්යක්ෂම ලෙස භාවිතා කිරීම සහ ඒ සඳහා සැලසුම් සකස් කිරීම.

දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් අංශය දිස්ත්‍රික් රැකියා පුහුණු මධ්‍යස්ථානය දිස්ත්‍රික් කෘෂිකර්ම අංශය.

මහජනයා ආරක්ෂා කිරීම, මහජනතාව සඳහා අත්‍යාවශ්‍ය සේවා ලබා දීම.

රාජ්‍ය නොවන සංවිධාන සමඟ ඒකාබද්ධව දිස්ත්‍රික්කයේ ඇතිවන ආපදා වලදී (ගං වතුර, සුළි සුළං, අධික වර්ෂාව, ඉඩෝරය) මහජනතාවගේ ආරක්ෂාව සඳහා පොලීසිය සහ යුධ හමුදා සහ නාවික හමුදා සහාය ලබා ගැනීම.

දිස්ත්‍රික්කයේ තිබෙන සියළු සංඛ්‍යාලේඛන තොරතුරු එක්රැස් කිරීම සහ ආරක්ෂා කිරීම.

මෙය අපේ සංඛ්‍යා ලේඛන අංශය විසින් සිදු කරනු ලබයි.

ප්‍රාදේශීය ග්‍රාම සංවර්ධන කටයුතු සඳහා සැළසුම් සකස් කිරීම හා සංවිධානය කිරීම.

- ✓ මාර්ග සංවර්ධනය, වාරි මාර්ග, විදුලි පහසුකම්.
- ✓ විමධ්‍යගත අයවැය මඟින් ලැබෙන ප්‍රතිපාදන වලින් දිස්ත්‍රික් සංවර්ධන කටයුතු සිදු කිරීම හා අධීක්ෂණය කිරීම.
- ✓ දැනට රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම. (දිවි නැගුම, ගම නැගුම, මඟ නැගුම)
- ✓ නිවාස සැලසුම
- ✓ යුද්ධයෙන් පීඩාවට පත්වූවන් සඳහා වන්දි ලබා දීම.

# 3. හැඳින්වීම.

## 3.1 දිස්ත්‍රික්කයේ මායිම්

ශ්‍රී ලංකාවේ වයඹ දෙසට උතුරින් මන්නාරම දිස්ත්‍රික්කය පිහිටා ඇත. දිස්ත්‍රික්කයේ දකුණු දිශාවෙන් පුත්තලම දිස්ත්‍රික්කයද, ගිණිකොන දිශාවෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයද, නැගෙනහිර දිශාවෙන් වවුනියා දිස්ත්‍රික්කයද, ඊසාන දිශාවෙන් මුලතිවු දිස්ත්‍රික්කය හා උතුරු දිශාවෙන් කිලිනොච්චි දිස්ත්‍රික්කයද මායිම් ලෙස පිහිටා ඇත.



ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමෙන් භූමි ප්‍රමාණය.

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | ප්‍රමාණය | |
|---|---|---|
| | වර්ග කි.මී. | ප්‍රතිශතය |
| මන්නාරම නගරය | 226.88 | 11.33 |
| නානාට්ටාන් | 129.25 | 6.46 |
| මුසලි | 474.22 | 23.69 |
| මාන්තෙයි බටහිර | 658.90 | 32.91 |
| මඩු | 512.82 | 25.61 |
| එකතුව | **2,002.07** | **100.00** |






## 3.2 වැදගත් ස්ථාන

තිරුකේදීශ්වරම් කෝවිළ, මරද මඩු දේවස්ථානය, ඕලන්ද කොටුව, අරිප්පු කොටුව, අරිප්පු අල්ලිරාණි කොටුව, රාමා (ආදම්ගේ ) පාලම, වැල් පාලම, බයෝබැබ් ගස හා ප්‍රදීපාගාරය දිස්ත්‍රික්කය තුළ වැදගත් ස්ථාන වශයෙන් හඳුන්වා දිය හැකිය.





















ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ කොවිල් අතුරෙන් මෙම තිරුකේදීශ්වරම් කෝවිළ ප්‍රමුඛ වේ. “ නායන්වල ” වේද ගීත ගායනයෙහි ප්‍රසිද්ධ දේවාලයක් ඇත. මන්නාරම සිට උතුරු දිශාවට දළ වශයෙන් සැතපුම් 6.5ක් පමණ දුරින් වයඹ මුහුදේ සිට දළ වශයෙන් සැතපුම් 0.5 ක් දුරින් තිරුකේදීශ්වරම් කෝවිළ පිහිටා ඇත. 16 වන ශත වර්ෂයේදී මෙම කෝවිළ පෘතුගීසීන් විසින් සම්පූර්ණයෙන්ම විනාශ කර තිබේ. 1903 වසරේ මෙය ප්‍රතිසංස්කරණය කරන ලදී. ප්‍රතිසංස්කරණයෙන් පසු 1952 වසරේ මෙහි මුල්ම (කුම්බාභිශේක) පූජාව සිදු කරන ලදි.




වන්නි වන සංරක්ෂිතයට අයත්ව පිහිටා තිබෙන ඉතා පැරණි මරදා මඩු දේවස්ථානය ලොව පුරා බැතිමතුන්ගේ පුද බිමකි. වාර්තාවලට අනුව 1659 වසරේ පෙබරවාරි මස 22 දින ඕලන්ද ආක්‍රමණය විසින් මන්නාරම යටත් කොට ගත් අවස්ථාවේ මෙහි පුද පූජා පැවැත්වීම තහනම් කර ඇත. මාන්තෛ ග්‍රාමයේ සිට වන්නි කැළෑවේ පිහිටා ඇති වැවට ආසන්නම ප්‍රදේශයේ මරද මඩු සුරුවම දැන් පිහිටා ඇති ස්ථානයට ගෙන ගොස් ඇත.




මන්නාරම දිස්ත්‍රික්කයේ ප්‍රසිද්ධියට පත්ව තිබෙන බයෝබැබ් ගස ශත වර්ෂ 15 කට පෙර අරාබි ජාතිකයන් විසින් ගෙන එන ලදී. මන්නාරම පල්ලිමුනේ ප්‍රදේශයේ පිහිටා ඇති මෙම ගස මීටර් 7.5 ක් උසින් හා වට ප්‍රමාණය මීටර් 19.51 කින් යුක්තය. මෙම ගසෙහි වයස දළ වශයෙන් වසර 750 ක් පමණ වේ. වෙළඳාම් කටයුතු හේතුවෙන් ලංකාවට පැමිණි අරාබියානු ජාතිකයන් ඔවුන්ට ආහාර සැපයීම සඳහා මෙම ගස පැළ කර ප්‍රයෝජනයට ගෙන ඇත.

.


ප්‍රදීපාගාරය

මෙය ඉදිකරන ලද්දේ 1915 වසරේය මෙහි උස අඩි 64 කි. සෑම විනාඩි 5 කට වරක් පුරාවට මෙයින් ආලෝකය විහිදුවයි. මුහුදු සැතපුම් 10 ක පමණ දුර ප්‍රමාණයකින් දැකීමට හැකි බව කියති. මෙම ප්‍රදීපාගාරය මන්නාරමේ සිට වයඹ දිශාවේ පිහිටි තලෛයිමන්නාරමෙහි ඉදිකොට ඇත. තලෛයිමන්නාරමේ සිට ඉන්දියාවට ගමන් කිරීමට කෙටිම මාර්ගය පිහිටා ඇත්තේ මෙහිය.

මෙම වැල් පාලම 1935 වසරේ මල්වතු ඔය හරහා ගමන් කිරීම සඳහා සාදන ලදී. මෙම පාලම මන්නාරම ප්‍රධාන මාර්ගයේ මඩු හන්දියට නුදුරින් පිහිටි කුංජුකුලම් ප්‍රදේශයේ පිහිටා තිබේ. පාලමෙහි දිග මීටර් 150 ක් සහ පළල මිටර් 1.2 ක් පමණ වේ.

.


වැල් පාලම


අරිප්පු කොටුව

මෙම කොටුව පෘතුගීසීන් විසින් ඉදිකරන ලදී. 1658 ඕලන්ද ජාතිකයින් විසින් මෙය අත්පත් කරගෙන ඇත. 2 වන රාජසිංහ රජුගේ සිරකරුවෙකු වූ රොබට් නොක්ස් රජුගෙන් මිදී පැමිණියේ මෙම කොටුවටය. මෙම ඉංග්‍රීසි ජාතික රොබට් නොක්ස් 2 වන රාජසිංහ රජු 1659 වසරේ අල්ලාගෙන ඇත. පසුව ශ්‍රී ලංකාවේ පෙඩ්‍රික් නෝත් ආණ්ඩුකාරවරයාගේ නිලධාරීන්ගේ සංචාරක නිවාසය වශයෙන් භාවිතා කර ඇත.


අල්ලිරාණි කොටුව




මෙම අල්ලිරාණි කොටුව මන්නාරම නගරයේ සිට දළ වශයෙන් කිලෝමීටර් 45 ක් දුරින් මුත්තරිප්පුතුරයි ප්‍රදේශයෙහි පිහිටා ඇත. මෙහි මාතොට දක්වා උමං මාර්ගයක් ඇති බවට විශ්වාස කරයි. එහි විවිධ කොටස් මුහුදු ඛාදනය නිසා විනාශ වී ඇති අතර ඉතිරි වී ඇති කොටස් ඒ පිළිබඳව සාක්ෂි දරයි. මෙම අල්ලිරාණි කොටුවෙහි පහත මාලයේ කුඩා නිදන කාමර 04 කින් හා පළමු මහල විශාල ප්‍රමාණයේ භෝජන ශාලාවකින්ද, සුඛෝපභෝගී නිදන කාමරයකින්ද සමන්විත වී තිබේ. ඩොරික් මහතා විසින් මෙහි පිඹුර සකසා ඔවුන්ගේම අධීක්ෂණය යටතේ ඉදිකරනු ලැබී යැයි විශ්වාසයක් පවතී.


මන්නාරම කොටුව






මෙය පෘතුගීසීන් විසින් 1560 වසරේ ඉදිකර ඇත. මෙම බලකොටුව දැවැන්ත බිත්ති 4 කින් සමන්විතය. යුධමය කාලය තුලදී යුධ සෙබළුන් හට මුහුද මඟින් ගමන් කිරීමට හැකිවන පරිදි ආරක්ෂාව සැපයීමට මෙය ඉදිකොට ඇත. පසුව මෙම බලකොටුව ඕලන්ද නාවික හමුදාවේ ප්‍රයෝජනයට ගෙන ඇත.









මෙම පාලම වැලි හා හුණු ගල් මිශ්‍රව ඉන්දියාව හා ලංකාව එක් කිරීම සඳහා ස්වභාවිකව පිහිටා ඇත. මෙම පාලම දෙමළ මාධ්‍යයෙන් රාමා පාලම , ඉංග්‍රීසි භාෂාවෙන් ආදම් පාලම වශයෙන් හා මළයාල භාෂාවෙන් රාමසේදු පාලම යනුවෙන් හඳුන්වනු ලබයි. මෙහි කිලෝමීටර් 30 ක් දිගින් හා ජල මට්ටම යටින් මීටර 1.5 – 3.5 අතර වැලි කන්දක් ඇත. පුරාතන යුගයේ ලේඛනවල සඳහන් පරිදි 15 වන ශත වර්ෂයේ මෙම පාලම ඔස්සේ ජනතාව ගමන් කළ බව පැවසේ

## 3.3.දිස්ත්‍රික්කයේ ස්වභාවික සම්පත්









## 3.4 දිස්ත්‍රික්කයේ ආර්ථික හා ජීවනෝපාය තත්වයන්

මන්නාරම දිස්ත්‍රික්කයේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගයක් වශයෙන් කෘෂිකර්මය හා ධීවර කර්මාන්තය හැඳින්විය හැකිය. 70% ක් කෘෂිකර්මය, **25%** ක් ධීවර , **5%** ක් වෙනත් රැකියාවල නිරත වන අතර **61.4%** වී වගා කටයුතු වල යොමු වී සිටියි.

ඉහත ආර්ථික කටයුතු සිදු කරනු ලබන පිරිමින් 70.5% ක් පමණ සිටී. වයස අවුරුදු 35-39 දක්වා පිරිමින්ද, වයස අවුරුදු 25-29 අතර කාන්තාවන්ද, 5% ක් කිසිදු රැකියාවක් නොමැතිව සිටී.

## 3.5 දිස්ත්‍රික්කයේ වාරි මාර්ග කටයුතු.

✓ **තේක්කම් බැම්ම**

මෙය මල්වතු ඔය හරහා ඉදිකර ඇති අතර ඇල මාර්ග දෙකක් හරහා ජලය හරවා යවා ඇත. එහි එක් ඇල මාර්ගයක් කටුකරෛ වැව හා අනෙක් ඇල මාර්ගය යොධ වැව හරහා ගලා යාමට සලසා ඇත. අතිරේක ජලය මල්වතු ඔය හරහා මුහුදට යවනු ලැබේ.

✓ **යෝධ වැව**

1969 වසරේ සිට වාරිමාර්ග දෙපාර්තමේන්තුව මෙම වැවේ කටයුතු කරනු ලැබේ. මෙම වැවට ජලය සැතපුම් 16.25 ට වඩා මල්වතු ඔයේ ඇල මාර්ගයක් මඟින් ගෙන එයි. මෙම වැවේ අක්කර 31,500 පමණ ප්‍රමාණයක ජලය රඳා පවතී. අක්කර 30,000 ක කුඹුරු ගොවිතැන සඳහා ජලය සපයනු ලබයි. වාන් දොරවල් 10 කින් මෙය සමන්විත වේ.

- ඊට අමතරව වියායාත්තිකුලම් වැව හා අහදිමුරිප්පු කුලම් වැව මඟින් කුඩා වැව් වලට ජලය සපයා ඇත..












## 3.6 දිස්ත්‍රික්කයේ ජනගහනය

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් ජනගහනය

| ප්‍රාදේශීය ලේකම් කාර්යාල විස්තර | මුළු ජනගහනය |
|---|---|
| මන්නාරම නගරය | 72,675 |
| නානාට්ටාන් | 21,069 |
| මුසලි | 29,184 |
| මාන්තෛ බටහිර | 25,489 |
| මඩු | 12,773 |
| එකතුව | **161,190** |




ජනවර්ග මට්ටමෙන් ජනගහනය

| ජන වර්ග | සංගණන එකතුව |
|---|---|
| දෙමළ | 90,258 |
| ඉස්ලාම් | 69,966 |
| සිංහල | 966 |
| එකතුව | **161,190** |



## 3.7. දිස්ත්‍රික්කයේ කාළගුණික තත්වය

මන්නාරම දිස්ත්‍රික්කය ඉතා උෂ්ණ අධික ප්‍රදේශයකි. වර්ෂාව නැති උෂ්ණාධික දිස්ත්‍රික්කයක් බවට හඳුන්වයි. මන්නාරම දිස්ත්‍රික්කයේ උෂ්ණත්වය 28**c – 33c** වන අතර වර්ෂාව මිලි මීටර් 74 - මිලි මීටර් 104 අතර පවතී.

## 3.8. දිස්ත්‍රික්කයේ සංඛ්‍යා ලේඛන

| | |
|---|---|
| ✓ දිස්ත්‍රික්කයේ නම | : මන්නාරම |
| ✓ පළාතේ නම | : උතුරු පළාත |
| ✓ මුළු බිම් ප්‍රමාණය | : 2,002 sq.km |
| ✓ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සංඛ්‍යාව | : 05 |
| ✓ ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව | : 153 |
| ✓ ගම්මාන සංඛ්‍යාව | : 622 |
| ✓ ඡන්ද කොට්ඨාස සංඛ්‍යාව | : 70 |
| ✓ මහ නගර සභා සංඛ්‍යාව | : නැත |
| ✓ නගර සභා සංඛ්‍යාව | : 01 |
| ✓ ප්‍රාදේශීය සභා සංඛ්‍යාව | : 04 |
| ✓ නිවාඩු නිකේතන, රජයේ නිළ නිවාස | : 02 (01- අඛණ්ඩ වැඩ) |
| ✓ කලාප අධ්‍යාපන කාර්යාල සේවක සංඛ්‍යාව | :175 |
| ✓ පාසල් හා ගුරුවරුන් සංඛ්‍යාව | : 144 හා 1,994 |
| ✓ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව | : 06 |
| ✓ පළාත් සභා සභිකයින් සංඛ්‍යාව | : 05 |
| ✓ පළාත් පාලන මන්ත්‍රීවරුන් සංඛ්‍යාව | : 46 |
| ✓ ජන සංගණනය | :161,190-(2014 ජන සංගණන) |

## 4. ආයතන ව්‍යුහය සහ අනුමත කාර්ය මණ්ඩල තොරතුරු, සංවිධාන සිතියම

### 4.1 කාර්යාලීය සංවිධානය සිතියම



## 4.2 අනුමත කාර්ය මණ්ඩල තොරතුරු

**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය : මන්නාරම**

| වර්ගය | සේවය පංතිය/මට්ටම | අනුමත සංඛ්‍යාව | සහභාගී වූ සංඛ්‍යාව | ඇබෑර්තු |
|---|---|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ මට්ටම** | | | | |
| දිසාපති | SLAS I | 01 | 01 | - |
| අතිරේක දිසාපති | SLAS I | 01 | 01 | - |
| සහකාර දිස්ත්‍රික් ලේකම් | SLAS III | 01 | 01 | - |
| ප්‍රධාන ගණකාධිකාරී | SLActS I | 01 | 01 | - |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | SLActS I | 01 | 01 | - |
| ගණකාධිකාරී | SLActS III | 01 | 01 | - |
| ඉංජිනේරු | SLES III | 01 | 01 | - |
| පරිපාලන නිලධාරී | PMAS Supra | 01 | - | **01** |
| **ද්විතීක මට්ටම** | | | | |
| අයවැය සහකාර | Budget Asst. Service | 01 | - | **01** |
| සංවර්ධන සම්බන්ධීකාරක | Development Co-ord Service | 01 | 01 | - |
| කළමනාකරණ සහකාර **I** | PMAS I | 04 | 04 | - |
| | | | | |
| සංවර්ධන නිලධාරී | DO | 15 | 13 | **02** |
| කළමනාකරණ සහකාර **II** හා **III** | PMAS II & III | 17 | 16 | **01** |
| | | | | |
| දත්ත සැකසුම් නිලධාරී | Deo | 01 | - | **01** |
| භාෂා පරිවර්තක | TS | 01 | - | **01** |
| කාර්මික නිලධාරී | SLTS | 01 | - | **01** |
| සහකාර කාර්මික නිලධාරී | TA | 01 | 01 | - |
| සැලසුම් නිලධාරී | SLTS | 01 | - | **01** |
| **ප්‍රාථමික මට්ටම** | | | | |
| රියදුරු | DS | 07 | 04 | **03** |
| | | | | |
| සංචාරක නිකේතන භාරකරු | OES | 01 | 01* | - |
| බැඳුම්කරු | OES I | - | - | - |
| ආරච්චි | OES I | 01 | 01 | - |
| දුරකථන ක්‍රියාකරු | OES I | 01 | - | **01** |
| ආරක්ෂක නිලධාරී | OES I & II | 02 | 02 | - |
| | | | | |
| පණිවිඩකරු | OES II & I | 01 | 01 | - |
| කාර්යාල සහායක | OES II | - | - | - |
| | | | | |
| කාර්යාල කම්කරු / වතු කම්කරු | OES III | 02 | 02 | - |
| සනීපාරක්ෂක කම්කරු | OES III | 01 | - | **01** |
| | | | | |

ප්‍රාදේශීය ලේකම් කාර්යාල: මන්නාරම දිස්ත්‍රික්කය

| වර්ගය | සේවය පංතිය/මට්ටම | අනුමත සංඛ්‍යාව | සහභාගී වූ සංඛ්‍යාව | ඇබෑර්තු |
|---|---|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ මට්ටම** | | | | |
| ප්‍රාදේශීය ලේකම් | SLAS I | 05 | 05 | **-** |
| සහකාර ප්‍රාදේශීය ලේකම් | SLAS III | 05 | 01 | **04** |
| ගණකාධිකාරී | SLActS III | 05 | 05 | **-** |
| පරිපාලන නිලධාරී | PMAS Supra | 05 | - | **05** |
| ග්‍රාම නිලධාරී | GN Supra | 05 | 01 | **04** |
| **ද්වීයිතික මට්ටම** | | | | |
| සංවර්ධන සම්බන්ධීකාරක | Development Co-ord Service | 05 | 04 | **01** |
| කළමනාකරණ සහකාර **I** | PMAS I | 20 | 04 | **16** |
| සංවර්ධන නිලධාරී | DO | 25 | 11 | **14** |
| කළමනාකරණ සහකාර **II** හා **III** | PMAS II & III | 91 | 72 | **19** |
| දත්ත සැකසුම් නිලධාරී | DEO | 03 | - | **03** |
| භාෂා පරිවර්තක | Translator Service I | 05 | - | **05** |
| කාර්මික නිලධාරී | SLTS | 05 | - | **05** |
| සහකාර කාර්මික නිලධාරී | TA | 05 | 04 | **01** |
| ග්‍රාම නිලධාරී | GNS I & II | 153 | 134 | **19** |
| **ප්‍රාථමික මට්ටම** | | | | |
| රියදුරු | Driver Service | 10 | 10 | **-** |
| ආරක්ෂක නිලධාරී | OES II | 10 | 05 | **05** |
| පණිවිඩකරු | OES II | 05 | 04 | **01** |
| කාර්යාල කම්කරු වතු කම්කරු | OES III | 10 | 08 | **02** |
| සනීපාරක්ෂක කම්කරු | OES III,II, I | 05 | 03 | **02** |
| | | | | |

| වර්ගය | කළමනාකරණ සහකාර චක්‍රලේඛයට අනුව අනුමත කාර්ය මණ්ඩලය | සහභාගීත්වය | ඇබෑර්තු |
|---|---|---|---|
| | **දිස්ත්‍රික් ලේකම් කාර්යාල** | | |
| **ජ්‍යෙෂ්ඨ මට්ටම A** | **01** | **01** | **-** |
| **තුන්වන මට්ටම B** | **07** | **06** | **01** |
| **ද්වීයිතික මට්ටම C** | **43** | **35** | **08** |
| **ප්‍රාථමික මට්ටම D** | **16** | **11** | **05** |
| **තාවකාලික**<br>**අනියම්**<br>**කොන්ත්‍රාත් පදනම** | | **-**<br>**-**<br>**06** | |
| | **ප්‍රාදේශීය ලේකම් කාර්යාල** | | |
| **තුන්වන මට්ටම B** | **25** | **12** | **13** |
| **ද්වීතියික මට්ටම C** | **312** | **229** | **83** |
| **ප්‍රාථමික මට්ටම D** | **40** | **30** | **10** |
| **තාවකාලික**<br>**අනියම්**<br>**කොන්ත්‍රාත් පදනම** | | **-**<br>**-**<br>**14** | |

## 5. කාර්ය සාධනය

### 5.1 රාජ්‍ය පරිපාලන කටයුතු

#### 5.1.1 ග්‍රාම නිලධාරී ක්‍රියාකාරකම්

| ප්‍රා.ලේ.කොට්ඨාශය | ග්‍රාම නිලධාරී කොට්ඨාශය |
|---|---|
| මන්නාරම නගරය | 49 |
| නානාට්ටන් | 31 |
| මාන්තෙයි බටහිර | 36 |
| මඩු | 17 |
| මුසලි | 20 |
| එකතුව | 153 |

මෙම දිස්ත්‍රික්කය ග්‍රාම නිලධාරී වසම් 153 ක්ම අයත්ව ඇතත් 2014/01/01 හිදී ග්‍රාම නිලධාරීන් 110 ක් පමණක් සේවය කරමින් සිටියෝය. ග්‍රාම නිලධාරී වසම් 43 ක් පුරප්පාඩු වී තිබුණි. 2013.05.04 දිනයේදී පැවැත්වූ තරඟ විභාගය මඟින් ග්‍රාම නිලධාරී සේවයේ III වන ශ්‍රේණියට පත්වීම් ලැබූ ග්‍රාම නිලධාරීන් 30 දෙනෙක් 2014/03/10 සිට මාස 03 ක කාල පරිච්ඡේදය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨසය හා ග්‍රාම නිලධාරී වසම් වල තමන්ගේ හුහුණුවද නිම කර 2014/06/10 දිනයේදී තම තමන්ගේ ස්ථිර පත්වීම ලබාගෙන ඇත. තවද 2014/12/31 දිනයේදී පුරප්පාඩු 19 ක් පෙනුනේය. තවද ඉහත සඳහන් තරඟ විභාගය ප්‍රකාරව දෙවන වටයේ ග්‍රාම නිලධාරීන් 07 ක් 2014/10/15 හිදී පුහුණුව සඳහා තෝරාගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට රාජකාරිය සඳහා අනුයුක්ත කර ඇත.

#### 5.1.2. අභ්‍යන්තර විගණන කටයුතු

අභ්‍යන්තර විගණන මෙහෙයුම යනු අදාල සංවිධානයේ මෙහෙයුම් කාර්යයන්ට අගය එකතු කිරීමටත් ඒවා වැඩි දියුණු කිරීමටත් සැලසුම් කළ ස්වාධීන වූද විෂය ගතවූද සහතික කිරීමේ හා උපදේශන කාර්යයකි. සංවිධානයේ අවදානම් කළමනාකරණ පාලන සහා යහ පාලන ක්‍රියාවලි වල ඵලදායිකත්වය අගයා එය වැඩි දියුණු කිරීම සඳහා ක්‍රමානුකූල සහ විනයානුකූල ප්‍රවේශයක් ඉදිරිපත් කිරීම තුළින් අභ්‍යන්තර විගණනය සංවිධානයේ අරමුණ මුදුන්පත් කර ගැනීම සඳහා සහාය වන බව මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් තුමා විසින් 2009/10/07 වැනි දිනදී නිකුත් කරන DMA/2009/03 අංක දරණ චක්‍රලේඛයේ 23 වැනි පිටුවේ සඳහන් කර ඇත.

මේ අනුව 2014 මුදල් වර්ෂයේ සිදු කරන ලද අභ්‍යන්තර විගණනය නිසා මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ඒ යටතේ වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 හි සිදු කර ඇති ඇගයීම් ක්‍රියාවන් පහත සඳහන් වේ.

1. මන්නාරම දිස්ත්‍රික්කයේ ස්ථිරව පදිංචිව සිටින රටින් පිට ජීවත් වන විශ්‍රාමිකයන් විසින් විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ටම ඔවුන් විසින් එවන ලද ලියකියවිලි සත්‍යතාවය දැන ගැනීමට නොහැකි හෙයින් එම ගෙවීම් 2014 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ සිට අත්හිටුවා එම ගෙවීම් සියල්ල විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා ගෙවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 හි පවිත්‍රතා හා ආරක්ෂක සේවාවන් ලබා දෙන පෞද්ගලික ආයතන වලට 1001 හා 1003 වැය ශීර්ෂ යටතේ සිදු කෙරෙමින් පැවති ගෙවීම් 1405 යන වැය ශීර්ෂය යටතේ ගෙවීම් කළ යුතු බව උපදෙස් දෙන ලදී.

3. මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 හි දක්නට ලැබෙන ගෙවීම් වවුචර්පත් සඳහා මුදල් පොතේ ලබා දී ඇති අංකයන් විසර්ජන ගිණුම් ලෙජරයේ 12 වන ජේදයේ සටහන් කිරීමට උපදෙස් දෙන ලදී.

4. අවසන් වූ වර්ෂය සඳහා වූ ගෙවීම් කිසිවක් පවත්නා වර්ෂයේ ලබා දෙන විට එය විසර්ජන ගිණුම් ලෙජරයේ 14 වන ජේදයේ සටහන් කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදී.

5. මුදල් රෙගුලාසි 156 (5) අනුගමනය නොකර මුදල් ලෙජරවල ටිපෙක්ස් මගින් සිදු කරන ලද වෙනස් කිරීම් අඛණ්ඩව සිදු නොවීමට කටයුතු යොදන ලදී.

6. මුදල් රෙගුලාසි 156 (6) අනුව ලියකියවිලි නිසා පාලනයෙන් නිසි අයුරින් යහපත් තත්වයෙන් තබා ගැනීමට අවශ්‍ය නිසි ක්‍රියා මාර්ග සිදු කර ලබා දී ඇත.

7. මුදල් රෙගුලාසි 260 අනුව තෙවන පාර්ශවයට අදාල ගෙවීම් සියල්ල නිසි පාර්ශවකරුවන්ට චෙක්පත් මගින් ලබා දීමට උපදෙස් ලබා දෙන ලදී.

8. මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2009/06/09 වන දින නිකුත් කරන ලද DMA/2009(01) යන අංක දරන විගණන හා කළමනාකරණ චක්‍රලේඛයේ 09 ජේදය යටතේ සඳහන් කර ඇති පරිදි 2014 වර්ෂයට අදාල කාර්තු 03 සඳහා වූ අභ්‍යන්තර විගණන වාර්තා ඉදිරිපත් කර ඇති දිනය හා ඒ සඳහා විගණන හා කණමනාකරණ කමිටු රැස්වීම පවත්වන ලද දිනයන් පහත සඳහන් වේ.

9.

| කාර්තුවේ නම | දෙපාර්තමේන්තු ප්‍රධානියාට ඉදිරිපත් කරන ලද දිනය | විගණන සහ කළමනාකරණ රැස්වීම් පවත්වන ලද දිනය |
|---|---|---|
| පලවන කාර්තුව | 2014-03-20 | 2014-03-21 |
| දෙවන කාර්තුව | 2014-07-31 | 2014-08-25 |
| තෙවන කාර්තුව | 2014-10-31 | 2014-12-29 |

1) පලවන කාර්තුවට අදාල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ 07 හි මෙහි වැදගත්කම පිළිබඳව පැහැදිලි කරන ලදී.

2) දෙවන කාර්තුවට අදාල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී ගෙවීම් ක්‍රම වල දක්නට ලැබෙන අනිසි ක්‍රියා මාර්ග හා අඩුපාඩු පෙන්වා දී ඒවා අනාගතයේදී සිදු නොවීමට වග බලා ගන්නා ලදී.

3) තෙවන කාර්තුවට අදාල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මුදල් කළමනාකරණ අංශයේ අනුගමනය කරමින් සිටි රජයේ මුදල් භාර ගන්නා ක්‍රියාවන් පිළිබඳව පැහැදිලි කරන ලද අතර මෙම ක්‍රියාවන් වලක්වා ගැනීම සඳහා මුදල් රෙගුලාසි 143(3), 166, 182, 183, 184 හා 365 යනාදියට අනුව උපදෙස් හා ඔවදන් ලබා දී නිසි ක්‍රියාමාර්ගයක් පවත්වා ගැනීමට කටයුතු කරන ලදී.

### 5.1.3. ආදායම් රැස්කිරීම ක්‍රියාකාරකම්

2014 වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ලබා ගත් ආදායම් විස්තර පහත සඳහන් පරිදි වේ.

| ආදායම් සංකේතය | විස්තරය | එකතුව |
|---|---|---|
| 1003.07.02 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවට අදාල ලියාපදිංචි කිරීමේ ගාස්තු | 2,700,429.92 |
| 1003.07.03 | පෞද්ගලික දැව ප්‍රවාහනය | 299,576.00 |
| 1003.07.99 | අනෙකුත් | 33,150.00 |
| 1003.07.05 | රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට අදාල බලපත්‍ර ගාස්තු | 6,450.00 |
| 2002.01.01 | රජයේ ගොඩනැගිලි කුලී | 989,474.15 |
| 2002.01.99 | අනෙකුත් කුලී | 1,148,091.00 |
| 2002.02.99 | වෙනත් | 1,571,623.58 |
| 2003.02.06 | සත්ව හා වෘක්ෂලතා සංරක්ෂණ ආඥා පනත යටතේ ගාස්තු | 3,350.00 |
| 2003.02.13 | විභාග හා අනෙකුත් ගාස්තු | 717,200.00 |
| 2003.02.14 | මෝටර් රථ ප්‍රවාහන පනත යටතේ අය කරනු ලබන ගාස්තු හා අනෙකුත් ලැබීම් | 6,740,373.00 |
| 2003.02.99 | විවිධ | 40,575.48 |
| 2003.04.00 | මෝටර් බයිසිකල් බෙදා දීම | 44,085,000.00 |
| 2003.99.00 | අනෙකුත් ලැබීම් | 6,360,089.28 |
| 2004.01.00 | මධ්‍යම රජය | 6,374,601.21 |
| 2006.02.00 | ප්‍රාග්ධන වත්කම් විකිණීම | 3,956,895.00 |
| එකතුව | | 75,026,878.62 |

## 5.1.4. මිනිස් බල හා රැකී රක්ෂා අමාත්‍යාංශයේ දියත් කළ ක්‍රියාදාමයන්

**"භූගෝලීය මට්ටමේ තරඟකාරී වෘත්තීය සමාජයක් ගොඩනැගීම හා විවෘතව සම්පත් වල සම්පූර්ණ ශක්තිය මෙම සමාජ ආර්ථික සංවර්ධනය තකා යොදවමි ."**

මිනිස් බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 2013 වර්ෂයේ සිට මන්නාරම් දිස්ත්‍රික්කයෙන්ද පත්කර ඇති අතර මෙම දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘතීන් අදාල නිලධාරීන් විසින් ක්‍රියාවට නැංවේ. පළාත් සංවර්ධන අමාත්‍යාංශයේ යටතේ ක්‍රියාත්මක වූ මිනිස් බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුවේ දැනට දීප ව්‍යාප්ත මට්ටමේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය මඟින් තම වැඩපිළිවෙල ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් පවතී.

ඒ අනුව 2014 වර්ෂයේ මන්නාරම දිස්ත්‍රික්කයේ මන්නාරම නගරය නානාට්ටාන් මුසාලි මඩු හා මාන්තේයි බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල පහත සඳහන් පුහුණු පාඨමාලා පැවැත්වීමට කටයුතු කෙරුණි.

1. අ.පො.ස. සාමාන්‍ය පෙළ/ උ/ පෙළ ශිෂ්‍යයින් සඳහා වූ වෘත්තීය මාර්ගෝපදේශන දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණය
2. අවශ්‍යතාව මත වන පුහුණු පාඨමාලාවන්
3. ව්‍යවසායකත්ව පුහුණු පාඨමාලා
4. ගුරුභවතුන් දැනුවත් කිරීමේ වැඩමුළු
5. ස්වයං රැකියා ප්‍රවර්ධනය කිරීම.
6. රැකියා අවස්ථා ජය ගැනීමේ වැඩසටහන් යනාදීය පුහුණු ලබා දීමට කටයුතු කර ඇත.

උක්ත පුහුණු වැඩසටහන් වල පාසල් ශිෂ්‍යයන් පාසැල් අතහැර ගිය අය, ස්වයං රැකියාවක් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන්නන් හට සහභාගී විය හැකිය. උක්ත පුහුණු පාඨමාලා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සේවයේ නිරත මානව සම්පත් සංවර්ධන නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සේවය කරන මානව සම්පත් සංවර්ධන නිලධාරීන්, වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරීන් මඟින් දියත් කෙරුණි. අවසාන වශයෙන් රැකියා විරහිත තරුණ තරුණයින් උක්ත පුහුණු වැඩසටහන් අවශ්‍ය වන්නන් මානව සම්පත් සංවර්ධන නිලධාරීන් (HRDO ) දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට ගොස් මුණ ගැසී තම දත්ත ලියාපදිංචි කරන අතර වෘත්තීයමය අවස්ථාව හා පුහුණු පිළිබඳව උපදෙස් හා මඟපෙන්නවීම් ලබා ගත හැකිවේ.





ජාතික ඵලදායිතා සම්මාන

මහින්ද චින්තන වැඩසටහනට අනුව ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන රට පුරා දියත් කෙරිණි. මේ අනුව මන්නාරම් දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල පහ (05) ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කර වර්තමානයේ අළුත් මුහුණුවරකින් දර්ශනය වන අතර මහජනයා වෙත ඉතා කෙටි කළක් තුළ විශාල සේවාවක් ද සැපයීමට අවකාශය ලැබී ඇත. මෙම අවස්ථාවේ ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශයෙන් ලබා දෙනු ලබන ජාතික ඵලදායිතා සම්මාන 2012/2013 යන සම්මාන මන්නාරම් දිස්ත්‍රික්කයේ ප්‍රථම වතාවට මන්නාරම ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය ජාතික මට්ටමේ දෙවන ස්ථානයද නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල ජාතික මට්ටමේ සිව්වන ස්ථානයද හිමි කර ගැනීම සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් තුමා ඇතුළු සියළුම නිලධාරීන් වෙනුවෙන් සම්මාන හිමි වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ප්‍රාදේශීය ලේකම් හා නිලධාරීන් සියළු දෙනාටම තම ප්‍රශංසාව හා සුභ පැතුම් පිරිනමන අතර අනාගතයේදී මන්නාරම දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වන රජයේ දෙපාර්තමේන්තු පෞද්ගලික ආයතන හා පාසල් යන සියළුම ක්ෂේත්‍ර මෙම ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන සමඟ සම්බන්ධව ජාතික මට්ටමේ සම්මාන හිමිකර ගන්නා මෙන් ඉල්ලා සිටිමි.



මන්නාරම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
දෙවන ස්ථානය



නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
තුන්වන ස්ථානය



මඩු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
හතරවන ස්ථානය

## 5.1.5. මැතිවරණ දෙපාර්තමේන්තුවේ ක්‍රියාදාමයන්

2014 වර්ෂය සඳහා වන ඡන්ද දායකයන් සංගණන රාජකාරී මෙම දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරී වසම් 153 ක දී සංගණනය කිරීමේ නිලධාරීන් පත්කොට ඡන්ද දායකයන්ගේ ලේඛන සංශෝධන කිරීමේ රාජකාරී ක්‍රියාව ගැන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 05 ටම උපදෙස් පන්ති පැවැත්වීමෙන් අනතුරුව 2014 වර්ෂය සඳහා වන ජනතා දායකයන්ගේ සංගණන කටයුතු ඉටු කරන ලදී.

මේ අවස්ථාවේදී මියගිය අය, පදිංචි ස්ථාන මාරුවීම් වැනි හේතුවෙන් මැතිවරණ කොමසාරිස්ගේ චක්‍රලේඛනයට අනුව ඉවත් කර අවුරුදු 18 වයස සම්පූර්ණ වූ අළුතෙන් පදිංචියට ආ සහ පවතින ලේඛනයේ ඇති අයවළුන් විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත් භාරගෙන ඇත. තවද සහකාර ලේඛනගත නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඡන්ද පොල කොටස් නිලධාරීන් දෙදෙනෙකුගේ පරිශීලනයෙන් පසුව සකස් කර ඇතුළත් කරගත් අයවළුන්ගේ නම් “ආ” ලේඛනයෙන් ඉවත් කරන ලද අයවළුන්ගේ “අ” ලේඛනයේද සකසා පොදු මහජනතාවගේ ප්‍රදර්ශනයකට තබන ලදී.

තවද නිමිත කාලයේදී ලේඛනගත කිරීමට නොහැකි වූ අයට නැවත වරක් අවස්ථාව ඔක්තෝබර් මාසයේ අයිතිවාසිකම් ඉල්ලීම්ද ඉදිරිපත් කිරීමට දී අදාල අයට විභාග ඉටුකර සුදුසු අය ඇතුළත් කර ඇත.

ඉන් පසුව ඔක්තෝබර් මස 31 වන දින 2014 වර්ෂය සඳහා වන ඡන්ද දායකයන්ගේ ලේඛන සහකාර ලේඛන ගත කරන නිලධාරීයා විසින් සහතික කර ප්‍රකාශනය කරන ලදී. මේ අනුව 2014 වර්ෂය සඳහා වන මුළු ඡන්ද සංඛ්‍යාව 79,232 වේ.

තවද 2015 වර්ෂයේ පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණය වෙනුවෙන් නොවැම්බර්, දෙසැම්බර් මාස වල ඉදිරි කටයුතු ආරම්භ කර 2015/01/08 වැනි දින ඡන්ද මධ්‍යස්ථාන 70ක ඡන්ද විමසීම් කටයුතු සිදු කරනලද අතර ඡන්ද ගණන් කරන මධ්‍යස්ථාන 06 ක් පිහිටුවාගෙන ඡන්ද ගණන් කරන කටයුතු ඉටු කරන ලදී.

මෙම දිස්ත්‍රික්කයේ සෑම රජයේ නිලධාරීන්ගේ සහභාගීත්වය සමඟ දිසාපතිගේ මඟපෙන්වීම යටතේ මැතිවරණ හොඳින් පවත්වාගෙන යාමට මෙම දෙපාර්තමේන්තුව පූර්ණව සහභාගී වූ බව මෙයින් දන්වා සිටිමි.

### 5.1.6. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ක්‍රියාදාමයන්

| | |
|---|---|
| 1. ලියාපදිංචිය සඳහා ලබා ගත් ඔප්පු සංඛ්‍යාව | -4,855 |
| 2. ලබාගත් ඔප්පුවල අනු පිටපත් සංඛ්‍යාව | -4,115 |
| 3. පිටපත් ලබා ගැනීම වෙනුවෙන් ලබාගත් ඉල්ලුම් පත්‍ර සංඛ්‍යාව | |
| i ඉඩම් ලේඛනගත පත් ඉරු | -3,033 |
| ii ඔප්පු හා වෙනත් ලේඛන | -1,232 |
| 4. ලේඛන සෙවීම සඳහා ලබාගත් ඉල්ලුම් පත්‍ර සංඛ්‍යාව | |
| i ඉඩම් පොත් | -19 |
| ii ඔප්පු හා වෙනත් ලේඛන | -26 |
| 5. අයකරගත් ගාස්තු වල ප්‍රමාණය | |
| i ලියාපදිංචි කිරීමේ ගාස්තු | |
| (අ) ඔප්පු හා වෙනත් ලේඛන | -515,200.00 |
| ii ලේඛන සෙවීම සඳහා වන ගාස්තුව | |
| (අ)ඉඩම් පොත් | -9,500.00 |
| (ආ) ඔප්පු හා වෙත් ලේඛන | -13,000.00 |
| iii අනු පිටපත් වල ඇලවූ මුද්දර | |
| (අ) ඔප්පු හා වෙනත් ලේඛන | -18,317,333.00 |
| vi වෙනත් | |
| (අ) මුද්දර බදු පනත යටතේ අය කරන ලද අඩුපාඩු | -00 |
| (ආ) මුද්දර බදු පනත යටතේ අය කරන ලද දඩ මුදල | -53,042.00 |

සිවිල් ලේඛනගත කිරීම

| | |
|---|---|
| 1. ලියාපදිංචි කරන ලද විවාහ වල සංඛ්‍යාව | -87 |
| 2. අනුමත කරන ලද ප්‍රතිඥා පත්‍ර සංඛ්‍යාව (24 වගන්තිය) | -83 |
| 3. නිකුත් කරන ලද නිගමන වයස සහතික වල සංඛ්‍යාව | -34 |
| 4. විවාහ උප්පැන්න මරණ සහතික හා අනුමත වයස සහතික වල පිටපත් ලබා ගැනීම | |
| i ලබා ගත් ඉල්ලුම්පත්‍ර වල සංඛ්‍යාව | -1,458 |
| ii අය කරන ලද මුද්දර ගාස්තු | -212,000.00 |
| iii නිකුත් කරන ලද පිටපත් වල සංඛ්‍යාව | -2,247 |
| 5. විවාහ උප්පැන්න හා මරණ සහතික වල භාෂා පරිවර්තනය | |
| i භාෂා පරිවර්තන ඉල්ලුම්පත්‍ර වල සංඛ්‍යාව | -144 |
| ii නිකුත් කරන ලද භාෂා පරිවර්තන පිටපත් වල සංඛ්‍යාව | -175 |
| iii භාෂා පරිවර්තන මත අය කරන ලද ගාස්තු | -87,500.00 |

## 5.1.7.ආපදා කළමණාකරන කටයුතු

දිස්ත්‍රික් ආපදා කළමණාකරන මධ්‍යස්ථානය - මන්නාරම

| ව්‍යාපෘතිය | ප්‍රතිපාදන 2014 | වියදම 2014 |
|---|---|---|
| පාඨමාලා හා පුහුණු පංති පැවැත්වීම | 283,000.00 | 257,956.00 |
| සැළසුම් සහ සැකසීම | 312,000.00 | 284,607.00 |
| ආපදා පාලනය | 29,078,384.45 | 9,434,780.79 |






ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය

| ව්‍යාපෘතිය | ප්‍රතිපාදන 2014 | වියදම් 2014 |
|---|---|---|
| පානීය ජලය බෙදාහැරීම - නියඟය | 4,830,000.00 | 4,830,000.00 |
| ජල ටැංකි මිලදී ගැනීම | 1,056,332.50 | 1,008,000.00 |
| ගංවතුර සහනාධාරය | 17,700,000.00 | 17,700,000.00 |
| යටිතල පහසුකම් ප්‍රවර්ධනය කිරීම | 5,000,000.00 | 3,208,594.00 |
| නිවාස විනාශ වීම සඳහා වන සහනාධාර | 100,239,000.00 | 99,375,000.00 |
| ආපදා වලට ඔරොත්තු දෙන නිවාස යෝජනා ක්‍රම | 3,000,000.00 | 2,200,000.00 |
| තුවාල වූවන් සඳහා වන ගෙවීම් | 80,000.00 | 80,000.00 |





## 5.1.8.මෝටර් රථ වාහන දෙපාර්තමේන්තුවේ ක්‍රියාදාමයන්

| අනු අංකය | මාසය | නව ලේඛණ ගත | අලුත් බැඩියා කරන ලද ලේඛණ ගත | නිකුත් කරන ලද ලේඛණ ගත | ලැබී ඇති අංක තහඩු | නිකුත් කරන ලද අංක තහඩු |
|---|---|---|---|---|---|---|
| 1 | ජනවාරි | 205 | 11 | 161 | 22 | 8 |
| 2 | පෙබරවාරි | 185 | 10 | 257 | 24 | 21 |
| 3 | මාර්තු | 228 | 11 | 219 | 24 | 14 |
| 4 | අප්‍රේල් | 102 | 7 | 95 | 22 | 21 |
| 5 | මැයි | 159 | 8 | 122 | 18 | 22 |
| 6 | ජූනි | 137 | 11 | - | 42 | 13 |
| 7 | ජූලි | 148 | 11 | 304 | 19 | 25 |
| 8 | අගෝස්තු | 118 | 25 | 120 | 14 | 16 |
| 9 | සැප්තැම්බර් | 446 | 32 | 268 | 16 | 18 |
| 10 | ඔක්තෝම්බර් | 175 | 23 | 135 | 28 | 26 |
| 11 | නොවැම්බර් | 199 | 2 | 74 | 45 | 28 |
| 12 | දෙසැම්බර් | 191 | 22 | 140 | 11 | 11 |
| එකතුව | | **2,293** | **173** | **1,041** | **285** | **223** |





## 5.1.9.විශ්‍රාම වැටුප් පිළිබඳ ක්‍රියාකාරකම්

| විශ්‍රාම වර්ගය | මන්නාරම නගරය | | නානාට්ටාන් | | මුසලි | | මඩු | | මාන්තේයි බටහිර | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | විශ්‍රාමිකයින් ගණන | වටිනාකම | විශ්‍රාමිකයින් ගණන | වටිනාකම | විශ්‍රාමිකයින් ගණන | වටිනාකම | විශ්‍රාමිකයින් ගණන | වටිනාකම | විශ්‍රාමිකයින් ගණන | වටිනාකම | විශ්‍රාමිකයින් ගණන | වටිනාකම |
| සිවිල් | 564 | 115,655,710.89 | 135 | 30,539,347.72 | 26 | 5,782,659.68 | 32 | 5,489,456.52 | 37 | 7,006,337.95 | 794 | 164,473,512.76 |
| වැන්දඹු | 258 | 61,641,941.74 | 69 | 13,305,453.73 | 9 | 1,745,861.62 | 11 | 2,017,505.76 | 24 | 3,444,103.32 | 371 | 82,154,866.17 |
| අනත්දරු | 0 | - | 2 | 84,764.08 | 0 | - | 0 | - | 0 | - | 2 | 84,764.08 |
| ආබාධිත | 6 | 1,032,817.80 | 0 | - | 0 | - | 0 | - | 0 | - | 6 | 1,032,817.80 |
| ආරක්ෂක සේවා | 1 | 16,576.28 | 0 | - | 0 | - | 0 | - | 0 | - | 1 | 16,576.28 |
| පිටරට | 0 | - | 20 | 727,871.45 | 0 | - | 0 | - | 0 | - | 20 | 727,871.45 |
| පළාත් පාලන විශ්‍රාම | | | | | | | | | | | | |
| සිවිල් | 14 | 2,435,172.00 | 0 | - | 0 | - | 0 | - | 0 | - | 14 | 2,435,172.00 |
| වැන්දඹු | 15 | 2,376,827.68 | 0 | - | 0 | - | 0 | - | 0 | - | 15 | 2,376,827.68 |
| | | | | | | | | | | | | |
| එකතුව | **858** | **183,159,046.39** | **226** | **44,657,436.98** | **35** | **7,528,521.30** | **43** | **7,506,962.28** | **61** | **10,450,441.27** | **1223** | **253,302,408.22** |

### 5.1.10. ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ ක්‍රියාදාමයන්

අප රටේ සමාජ ආර්ථික තත්වයන් පිළිබඳ වන සංඛ්‍යා ලේඛන දත්ත රැස් කිරීම, වර්ගීකරණය කිරීම, පර්යේෂණය කිරීම ප්‍රකාශයට පත් කිරීම සංඛ්‍යා ලේඛන දත්ත සෙවීම් යනාදී කරුණු කෙරෙහි මධ්‍යම රජයේ නියෝජිත ආයතනයක් වන ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සතු සේවයකි. රජයේ ජාතික මට්ටමේ සැලසුම් ප්‍රතිපත්ති සකස් කිරීම්, මෙම කාර්යයන් වල ප්‍රගති ඇගයීමට ලක් කිරීම, යනාදී කරුණු කෙරෙහි අවශ්‍ය වන තොරතුරු සපයන අංශයකි. රැස්කරගන්නා වූ තොරතුරු ජනගහණ කෘෂි කර්මාන්තය, වාණිජ කර්මාන්ත, ස්ථාවර මිළ ගණන් දළ දේශීය ආදායම් යනාදී කරුණුද ඇතුළත් වේ. දිස්ත්‍රික් සංඛ්‍යා ලේඛන අංශයෙන් 2014 වර්ෂයේ ක්‍රියාත්මක සංඛ්‍යා ලේඛන තොරතුරු පිළිබඳ දත්ත පහත පරිදිවේ.

**1.** ආර්ථික සංගණනය - **2013/14**

මෙම ජනලේඛන අදියර හතරකින් පැවැත්වින.

1. දිස්ත්‍රික්කයේ පවත්නා සියළුම වතු වගුගත කිරීම.
2. කර්මාන්ත,වාණිජ්‍ය හා සේවාවන් වැනි කටයුතු වල නිරත සියළුම කොටස් වගු ගත කිරීම.
3. කුඩා පරිමාණ කෘෂිකාර්මික අංශයන් වගු ගත කිරීම,තොරතුරු එක් රැස්කිරීම, හා වතු පිළිබඳ තොරතුරු රැස් කිරීම.
4. වගු ගත කළ කර්මාන්ත හා සේවා කටයුතු වල නිරත අංශ වල තෝරා ගනු ලැබූ ආදර්ශ අංශ වල පුළුල් විස්තර එක් රැස් කිරීම.

**2.** ශ්‍රී ලංකා ශ්‍රම බලකා මිනුම දණ්ඩ

ශ්‍රී ලංකා ශ්‍රම බලකාය මිනුම් දණ්ඩ පළමු කාර්තුවේ සිට අඛංඩව පැවැත්වෙන මිනුම දණ්ඩක් වේ. මේ රටේ වත්මන් ශ්‍රම බලකා තත්වයන් මැන බැලීමට කාර්තුවෙන් කාර්තුවට සිදුවන වෙනස්කම් සොයා බලා ගැනීම සිදු කෙරේ

**3.** වී අස්වැන්න ඇගයීමේ මිණුම් දණ්ඩ

වී අස්වැන්න ප්‍රතිශත අනුපාතික ඇගයීම් කිරීමට දිස්ත්‍රික් මට්ටමේ හා දීප ව්‍යාප්ත මට්ටමේ වී අස්වැන්න ඇගයීම් මැන බැලීම සඳහා වර්ෂයකට දෙවතාවක් වී අස්වැන්න ඇගයීම් පැවැත්වේ.

**4.** ඉදිකිරීම් කර්මාන්ත පිළිබඳ මිණුම් දණ්ඩ

ඉදි කිරීමේ කර්මාන්ත පිළිබඳ මූලික තොරතුරු රැස් කිරීමේ වෙනුවෙන් අඛණ්ඩ වැඩසටහනක් වශයෙන් මෙම මිණුම් දණ්ඩ වාර්ෂිකව පැවැත්වීමට කටයුතු යොදා ඇත.

**5.** වී පිළිබඳ සංඛ්‍යා ලේඛන

එක් අඛංඩ පියවරක් ලෙස දිස්ත්‍රික්කයේ පවත්නා සියළු කුඹුරු ඉඩම් හඳුනා ගැනීම හා වපුරන ලද අස්වැන්න නෙලන ලද වී වගා විස්තාරණය පිළිබඳ තොරතුරු වාර්ෂික පැවැත්වේ.

**6.** ගොඩ භෝග පිළිබඳ විස්තර

යල මහ කන්නයේ භෝග වගාවන්, ස්ථිර හා සාමාන්‍ය ස්ථාවර භෝග වගාවන් හා ඒවා වගා කරන විස්තාරණය නිෂ්පාදන ධාරිතාව යන ප්‍රමාණයන් රැස් කිරීමට කටයුතු යොදා ඇත.

**7.** උස් බිම් වගාව

මෝසම් වගාව හා ස්ථිර හා සාමාන්‍ය ස්ථිර වගාව ඒවා වගා කරන ලද විස්තර නිෂ්පාදන ප්‍රමාණය ආදී එක් රැස් කරන ලදී.

**8.** පශු සම්පත් පිළිබඳ සංඛ්‍යා ලේඛන

දිස්ත්‍රික් මට්ටමේ පශු සම්පත්වල සංඛ්‍යාත්මක ප්‍රමාණයන් පිළිබඳ සංඛ්‍යා ලේඛන තොරතුරු ඒවායේ නිෂ්පාදන පිළිබඳ සංඛ්‍යා ලේඛන රැස් කරන අතර බලපත්‍ර ලත් ගව ඝාතන ස්ථාන වල ඝාතනය කරනු ලබන පශු සම්පත් සංඛ්‍යාව ප්‍රමාණයන් පිළිබඳ තොරතුරුද රැස් කෙරේ.

**9.** සිල්ලර නිෂ්පාදන මිළ ගණන් පිළිබඳ සංඛ්‍යා ලේඛන තොරතුරු

ආහාර වර්ග වල හා නානාවිධ භාණ්ඩ වල මිළ ගණන් දිස්ත්‍රික්කයේ සති, මාසික, වාර්ෂික පදනමෙන් රැස් කෙරේ. තවද දේශීය නිෂ්පාදනයන්හි මිළ ගණන් මාසිකව රැස් කෙරේ.

**10.** පළාත් පාලන සංඛ්‍යා ලේඛන

දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක ප්‍රාදේශීය සභා වල ආදායම්, වියදම් සභාවෙන් සපයනු ලබන සේවාවන් පිළිබඳ තොරතුරුද රැස් කරනු ලැබේ.

### 5.1.11. පරිපාලන අංශයේ ක්‍රියාදාමයන්

මෙම දිස්ත්‍රික් පාලනය මන්නාරම නගරය නානාට්ටාන්, මුසලි, මඩු සහ මාන්තෛ බටහිර ආදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ඇතුළත් විය. මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 05 ක්ම ප්‍රාදේශීය ලේකම් ලෙස පවත්වා ගෙන යනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සේවය කරන ප්‍රාදේශීය ලේකම්වරුන් තුන් දෙනෙකු පළවන පන්තියට උසස් කරන ලදී.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ඇති රජයේ කළමනාකරණ සහකාර සේවයට අයත් අනුමත කරන ලද කාර්ය මණ්ඩල 132 තිබියදී පුරප්පාඩු 36ක් දකිනවා. තවද රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය යටතේ නවක උපාධිධාරීන්, උපාධිධාරී පුහුණු ලාභීන් ලෙස විවිධ අමාත්‍යංශ යටතේ අනුයුක්ත කර ඇත.

ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් මහජනතාවන් හට ජාතික හැඳුනුම්පත ලබා ගැනීම සඳහා අයදුම්පත් 3647 ක් පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වෙත යවා සුදුසු පරිදි මහජනයාට ලැබිය හැකි පරිදි යවනවා ඇත.

2014 වර්ෂයේ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යංශය මඟින් මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත උපාධිධාරීන් 15 ක් ඔවුන්ගේ විෂය ක්ෂේත්‍ර වලට අනුකූලව පහත සඳහන් දෙපාර්තමේන්තු අමාත්‍යංශ වෙත උපාධිධාරී පුහුණු ලාභීන් ලෙස රාජකාරියට අනුයුක්ත කර ඇත.

උපාධිධාරී පුහුණු ලාභීන්ගේ තත්ව මාලාව

| අංකය | අමාත්‍යංශය / දෙපාර්තමේන්තුව | උපාධිධාරීන් ගණන |
|---|---|---|
| 01 | දේශීය තරුණ සේවා සභාව | 02 |
| 02 | විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභ සාධන අමාත්‍යංශය | 06 |
| 03 | සමාජ සේවා අමාත්‍යංශය | 01 |
| 04 | ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යංශය | 01 |
| 05 | ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව | 02 |
| 06 | අධ්‍යාපන අමාත්‍යංශය | 02 |
| 07 | රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යංශය | 01 |
| **එකතුව** | | **15** |

2014 අය වැය යෝජනාව ක්‍රියාත්මක කිරීම

**රජයේ ක්ෂේත්‍ර නිලධාරීන් හට යතුරු පැදි; / ස්කූටර් ලබා දීම**

2014 අයවැය යෝජනාව ක්‍රියාත්මක කිරීම යටතේ මන්නාරම දිස්ත්‍රික්කයේ පිරිමි නිලධාරීන් 591 හා කාන්තා නිලධාරිනියන් 146 දෙනෙකුට යතුරු පැදි / ස්කූටර් ලබා දෙන ලදී.





## 5.1.12. ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යංශයේ ක්‍රියාකාරකම්

| අනු අංකය | කරුණු | මුදල් ප්‍රතිපාදන | වියදම් | ඉතිරිය |
|---|---|---|---|---|
| 01 | 05 වසර ශිෂ්‍යත්ව විභාගයේ පෙනී සිටි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සම්මන්ත්‍රණ මාලාවක් 2014.05.29 දින පැවැත්වීය. | 115,500.00 | 85,585.00 | 29,915.00 |
| 02 | ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යංශයේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ මන්නාරම දිස්ත්‍රික්කයේ 2014.07.09 වන දින උත්සව පැවැත්වීම. | 370,000.00 | 273,424.38 | 96,575.62 |
| 03 | සමාජ ඒකාබද්ධතාව සංකේතවත් කරන වීදි නාට්‍ය මාලාවක් 2014.07.17 දින පැවැත්වීම. | 50,000.00 | 46,518.40 | 3,481.60 |
| 04 | පර්ශද නිවාස යෝජනා ක්‍රමය යටතේ ජලාප්‍රවාහන පද්ධතියක් සැකසීම. | 150,000.00 | 150,000.00 | _ |
| 05 | අළුතෙන් ආරම්භ කළ ගම්මානයේ අභ්‍යන්තර මාර්ග ඉදිකිරීම. කායාක්කුලි/කොන්ඩච්චි | 150,000.00 | 150,000.00 | _ |
| 06 | ලිපි ලේඛන | 7,500.00 | 7,500.00 | _ |
| | මුළු එකතුව | **843,000.00** | **713,027.78** | **129,972.22** |

### 5.1.13. තොරතුරු තාක්ෂණ උද්‍යානයේ ක්‍රියාකාරකම්

තොරතුරු තාක්ෂණ උද්‍යානය සංනිවේදන හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන යයි. 2014 වසරේ අමාත්‍යාංශය විසින් වෙන් කරන ලද මුළු ප්‍රතිපාදන රුපියල් 4,065,000.00 .2014 වර්ෂයේ දී පරිගණක පුහුණුව සහ අනෙකුත් සේවා විසින් අයකර ගත් ආදායම් විස්තර පහත සඳහන් පරිදි වේ.

| ආදායම් | | | | | |
|---|---|---|---|---|---|
| වර්ෂය | පරිගණක පුහුණු පාඨමාලාවන් | පරිගණක අළුත් වැඩියාව සහ නඩත්තු කිරීම | වෙනත් ආදායම් | මුළු එකතුව | සටහන |
| 2014 | 513,700.00 | 45,700.00 | 50,263.50 | 609,663.50 | ආදායම් සියල්ල රජයේ ආදායම් සියල්ල යටතේ තැන්පත් කර ඇත. |

පරිගනක පුහුණු පාඨමාලාවේ ශිෂ්‍යයන් 173 දෙනෙක් පුහුණු පාඨමාලාව අවසන් කර ඇත. මොවුන් වෙනුවෙන් සහතික පත් නිකුත් කර ඇත.

| අංකය | පාඨමාලාවේ නම | ශිෂ්‍ය සංඛ්‍යාව | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 2014 |
|---|---|---|---|
| 01. | Diploma in Microsoft Office 2013<br>කොටස 39<br>කොටස 40<br>කොටස 41 | 53<br>27<br>06 | 86 |
| 02. | Diploma in PC Hardware<br>කොටස 19<br>කොටස 20 | 11<br>03 | 14 |
| 03. | Diploma in Graphics Designing<br>කොටස 17<br>කොටස 18 | 07<br>02 | 09 |
| 04. | Diploma in Web Designing<br>කොටස 03<br>කොටස 04 | 11<br>05 | 16 |
| 05. | Certificate in Internet & E-mail<br>කොටස 18 | 05 | 05 |
| 06. | Information Technology Computer Educational Programme (ICEP)<br>කොටස 02 | 07 | 07 |
| 07. | ICT O/L | 05 | 05 |
| 08. | Student Training Funded by world vision | 11 | 11 |
| 09. | Teachers Training Funded by world vision | 20 | 20 |
| එකතුව | | | 173 |





## 5.2.සංස්කෘතික කටයුතු හා සමාජ සේවා කටයුතු

### 5.2.1. සංස්කෘතික හා ආගමික කටයුතු පිළිබඳ ක්‍රියාකාරකම්

- **දෙමළ හා සිංහල නව වසර වැඩසටහන්**

මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මන්නාරම දිස්ත්‍රික්කයේ දෙපාර්තමේන්තු හා ශ්‍රී ලංකාවේ ත්‍රිවිධ හමුදාවේ නිලධාරීන් එක්වී පැවැත් වූ දැවැන්ත දෙමළ හා සිංහල අළුත් අවුරුදු උත්සවය 2014.04.05 වන දින මන්නාරම මුරුගන් මහා විද්‍යාලයේ ක්‍රීඩා පිටියේදී සිදු කරන ලදී. මෙහි පරම්පරානුගත ක්‍රීඩා හා කලා වැඩසටහන් ද සිදු කරන ලදී.






- රජයේ ළමා නාට්‍ය උළෙල

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව ලංකා කලා සමාජයේ රාජ්‍ය නාට්‍ය කණ්ඩායමද එක්වී අවුරුදු පතා පිළියෙල කරන රජයේ නාට්‍ය උළෙල සඳහා වන තරඟාවලිය 2014.07.24 වන දින දිස්ත්‍රික් ලේකම් කාර්යාල සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලදී. එහිදී මන්නාරම සින්න පණ්ඩිවිරිච්චාන් රා.දෙ. මිශ්‍ර පාසල ජාතික මට්ටමින් ත්‍යාග ලබා ගෙන ඇත.

- රජයේ ළමා චිත්‍ර උළෙල

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය හා සංස්කෘතික දෙපාර්තමේන්තුවද රජයේ චිත්‍ර හා චිත්‍ර කණ්ඩායම් එක්වී පිළියෙල කරන රජයේ ළමා චිත්‍ර උත්සවය 2014 වර්ෂය වෙනුවෙන් වූ තරඟ මන්නාරම සිත්ති විනායගර් හින්දු ජාතික පාසලේ දී 2014.09.22 වන දින පවත්වන ලදී. මෙම තරඟාවලිය පාසලක මණ්ඩපයේ පවත්වන ලදී.

- දිස්ත්‍රික් කලා උත්සවය

මෙම කලා උත්සවය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පිළියෙල කිරීමෙන් 2014.10.23 වන දින නානාට්ටාන් ප්‍රාදේශීය සංස්කෘතික ශාලාවේ දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධානත්වයෙන් හොඳින් පවත්වන ලදී. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ රුපියල් 25,000.00ක මුදල් අනුග්‍රහයෙන් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයද සම්බන්ධ කරමින් මෙම උත්සවය සිදු කරන ලදී.




- රජයේ නැටුම් උළෙල

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා කලා සමාජයේ රජයේ නර්ථන කණ්ඩායම, රජයේ නර්ථන කණ්ඩාම ආදී එක්වී පිළයෙල කරන රජයේ නැටුම් උළෙල 2014 සඳහා වන තරඟය 2014.10.27 වන දින මන්නාරම ශාන්ත සවේරියා පිරිමි විදුහලේ පවත්වන ලදී. මෙම වැඩසටහන පාසල් හා විවෘත මට්ටමින් පවත්වන ලදී. මෙහිදී මන්නාරම ශාන්ත සවේරියා බාලිකා ජාතික පාසල් මන්නාරම පෙරියමඩු විද්‍යාලය ශාන්ත කාර්මේල් මව කලා සමාජය ආදී ජාතික මට්ටමින් ස්ථාන ලබාගෙන ඇත.

- ආබාධිතයින් සඳහා වන රජයේ කලා උළෙල

මෙම කලා උළෙල 2014.12.29 වන දින මන්නාරම දිස්ත්‍රික් ලේකම් එම්.වයි.එස්. දේශප්‍රිය මහතාගේ ප්‍රධානත්වයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ශාලාවේදී ඉතා විශේෂයෙන් පවත්වන ලදී. මෙම කලා උත්සවය සමාජ සේවා දෙපාර්තමේන්තුව හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ එක්වූ ව්‍යාපෘතිය යටතේ නාට්‍ය, නැටුම්, සංගීත හා චිත්‍ර වැනි ක්ෂේත්‍ර මඟින් විශේෂිත දස්කම් ඇති අයවලුන්ගේ දක්ෂතාවය සමාජයට එළිකරගැනීමේ අරමුණින් රුපියල් 50,000.00 ක් ප්‍රතිපාදන වෙන් කිරීම යටතේ සිදු කරන ලදී.




- **උතුර, දකුණ සංස්කෘතික හා ක්‍රීඩා හුවමාරු වැඩසටහන**

උතුර දකුණ සමාජ සංස්කෘතික බැඳීම ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රීඩා හා යෞවන කටයුතු ග්‍රාමීය සංවර්ධන, සංස්කෘතික හා කලා කටයුතු, සමාජ සුභ සාධන ,පරිවාස, ගොඩනැගිලි, ආර්ථික ප්‍රවර්ධන, නිවාස, ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍ර, මානව සම්පත් , රැකී රක්ෂා අමාත්‍යංශයේ (දකුණු පළාත) හා මන්නාරම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඒකාබද්ධව සංවිධානය කරනු ලබන උතුර දකුණ සංස්කෘතික හා ක්‍රීඩා හුවමාරු වැඩසටහන 2014 වර්ෂයේ දෙසැම්බර් 19,20,21 යන දිනයන්හිදී මන්නාරම දිස්ත්‍රික්කයේ උත්කර්ෂවත් අන්දමෙන් පැවැත්විණි. මෙම උත්සවය 60 දෙනෙකුගෙන් යුතු දකුණු පළාත් තාරුණ්‍යයේ කණ්ඩායක් අප දිස්ත්‍රික්කය වෙත පැමිණ අප දිස්ත්‍රික්කයේ තරුණ අය සමඟ තම සංස්කෘතික හා ක්‍රීඩා වැඩසටහන් පවත්වා තම සුහදත්වය බෙදා හදා ගැනීමට අවස්ථාවක් උදා කර දෙන ලදී.






## 5.2.2. ළමා හා කාන්තා සංවර්ධන කටයුතු පිළිබඳ ක්‍රියාදාමයන්

**ජාතික පෝෂණ මාසය සඳහා ශිෂ්‍යයන් හට පැවැත්වුනු දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ මාලාව**

පරිවාස හා ළමා පරිවාස දෙපාර්තමේන්තුවේ (කොළඹ) අනුග්‍රහයෙන් දිස්ත්‍රික් ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී විසින් 2014.06.26 වන දින මන්නාර් ශුද්ධ වූ සවේරියාර් (පිරිමි) ජාතික පාසලේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 100 දෙනෙකුට මෙම සම්මන්ත්‍රණය පැවැත්විණි. සම්පත් දායකයා ලෙස මන්නාර් නගර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තුමා විසින් දේශනයක්ද පැවැත්විය.



අවබෝධාත්මක වැඩසටහන

**"අප සමනළයින්ගේ අත්තටු සවිමත් කරවමු"**



මෙම වැඩසටහන දිස්ත්‍රික් මට්ටමේ මුසලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දෙමාපියන් වැඩිහිටි ප්‍රජාව සම්බන්ධ කරගෙන කූලාන්කුලම් ගම්මානයේ උත්කර්ෂවත් අන්දමෙන් පැවැත්වීමට කටයුතු යොදා තිබිණ. මෙම වැඩසටහනේ සම්පත් දායකයා වශයෙන් මුසලි ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය අධිකාරී තුමා සහභාගී විය.

**ළමා සමාජය සඳහා දිස්ත්‍රික් මට්ටමේ පැවැත්වූ කොට්ඨාශ මට්ටමේ තරඟය.**

